# කුර්දි ජනතාවගේ සාපේක්ෂ අයිතිවාසිකම් බිදවැටීමේ ප්‍රශ්නයː තුර්කි ගැටුම ආශ්‍රයෙන් විශ්ලේෂණය කිරීම

ආර්.ඩබ්.ආර්.එම්.එස්.ඩී. රත්නමලල - ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය

මිනිසා මූලික කරගත් ගෝලීය තර්ජනයන්ගේ වර්ධනය නව ජත්‍යන්තර පර්යායේ ප්‍රවණතාවකි. නූතනයේ වර්ගවාදී, ආගම්වාදී බෙදීම්ද මිනිසා මූලික කරගත් ආරක්ෂාවේදී සාකච්ඡා වන ප්‍රධාන අංගය. ත්‍රස්තවාදය වැනි වාර්ගිකත්වය ප්‍රමුඛ කරගත් නූතනයේ හඳුනාගත හැකි සමාජ ගැටලුවක් වශයෙන් කුර්දි-තුර්කි වාර්ගික ගැටුම නිර්වචනය කළ හැකිය. මෙකී වාර්ගික ගැටුමේ ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර සාපේක්ෂ වශයෙන් අයිතිවාසිකම් බෙදී යෑමේ විෂමතාව ගැටුම කෙරේ කොතෙක් දුරට හේතු සාධක වූවාද යන්න විශ්ලේෂණ කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙම පර්යේෂණය සාපේක්ෂ විහීනතා න්‍යාය සහ එහි අන්තර්ගත විචල්‍යය හා සමගාමීව සිද්ධි අධ්‍යයනයට ව්‍යුහාත්මක පදනම සපයයි. මේ සඳහා භාවිත වන පර්යේෂණ ක්‍රමවේදයේදී වාර්ගික ගැටුමට සම්බන්ධ සාහිත්‍ය කෘති, අන්තර්ජාල ලිපි, විද්වත් ලේඛන, ආදී ද්විතීයික දත්ත මූලාශ්‍ර ප්‍රමුඛව ද, තුර්කි රාජ්‍යයේ නෛතික සම්මුති, ගිවිසුම්, ප්‍රොටොකෝල ආදී ප්‍රාථමික දත්ත මූලාශ්‍රය ද භාවිතයට ගැනේ. "කුර්දි ජනතාවගේ සාපේක්ෂ අයිතිවාසිකම් බිඳවැටීම සිදුවූයේ කෙසේද?" යන්න පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන අතර අයිතිවාසිකම් බිඳවැටීම ගැටුමට හේතු වූ ආකාරය සහ ගැටුම තුළ ඇති කළ ප්‍රතිඵල අනෙකුත් පර්යේෂණය ගැටලු වශයෙන් අවධානයට යොමු කෙරෙයි. පර්යේෂණයේ දී අවධානයට ගන්නා සිද්ධි අධ්‍යයනය සීමා නිර්ණයකට ලක් කෙරේ. එහිදී ඓතිහාසික වශයෙන් ගැටුමේ වර්ධනය පදනම වන අතර ඉන් ඔබ්බට 2009 සිට 2019 දක්වා නූතන දශකය වඩාත් අවධානයට යොමු කෙරෙයි. ඒ අනුව අදාළ සමාජ ක්‍රමයේ මුල් බැසගන්නා ලද පක්ෂපාතී දේශපාලන ව්‍යූහය, ත්‍රස්තවාදය, සමාජ විෂමතාව, දූගීභාවය යන කාරණා සාපේක්ෂ වශයෙන් අයිතිවාසිකම් බෙදී යෑමේ විෂමතාව කෙරේ බලපෑම් සහගත ස්වරූපයක් ඉස්මතු කෙරෙයි. මෙකී කාරණා කෙරේ තවදුරටත් අවධානය යොමු කරන කල්හි තුර්කි රාජ්‍ය පාර්ශ්වය සහ කුර්දි කැරලිකරුවන් අතරමැදී වූ ගිනිකොණදිග ප්‍රදේශවල පක්ෂපාතීත්වයක් නොදරන කුර්දි ප්‍රජාවක් නිරන්තරයෙන්ම පීඩනයට ලක්වීම, දේශපාලන ධ්‍රැවීකරණයේ අනිසි ප්‍රතිඵල, සාකච්ඡාවට බඳුන් නොවන ලද කුර්දි අයිතිවාසිකම් සහ දෙපාර්ශ්වයන්ගේ සන්නිවේදන දුර්වලතා මෙන්ම කලාපීය සහ ගෝලීය වශයෙන් තුන්වන පාර්ශ්වයන්ගේ බලපෑම ගැටුමේ තීව්‍රතාවට හේතුකාරක වීම යන සොයාගැනීම් නිබන්ධනය අවසානයේදී තහවුරු කරගන්නා ලදි.

*ප්‍රමුඛ පදː දිග්ගැස්සුන සමාජ ගැටලු, සාපේක්ෂ විහීනතාව, දේශපාලන ධ්‍රැවීකරණය*